# අඹන්පොළ ඇත්ගාල සහ බෙලිගම්මන හස්තියාගේ වියරුව

**සීවලි බණ්ඩාර මනතුංග ***

ඉංග්‍රීසි යුගයේදී පැවැත්වූ ඇත්ගාල් වැඩිහරියක් වරින් වර එතොරින් පැමිණි රාජකීය අමුත්තන් පිනවීම සඳහා ආණ්ඩුකාර වරයා මුල් කරගෙනම පැවැත්වුණු බව පෙනේ. රජයේ උසස්ම තැන්වල වැජඹෙන ඇත්තන් ඉදිරියේ තම තමන්ගේ හපන්කම් විදහා දක්වීමටත් එමගින් ඔවුන්ගේ ගෞරව සම්මානවලට පාත්‍ර වීමටත් අවස්ථාව කරගත් නින්දගම් ආදියේ උරුමක්කාරයන්වූ රදළවරු හා අලි ඇතුන් හිමි බලවතුන් මේවා පැවැත්වූ සෑම අවස්ථාවකම එහි මුල්තැන්ගෙන කටයුතු කළහ.

වල්අලින් ඇල්ලීමේදී, ඇත්ගාල කැඳවීම, අලි එළවීම සහ ගාල්කිරීම ආදි කුදු මහත් කටයුතු සිදුවූයේ ඒ සම්බන්ධව අත්දැකීම් ඇති රදළ ප්‍රභූන්ගේ මග පෙන්වීම අනුවය. වන්නිකරයේ වනාන්තරවල ගැවසෙමින් සිටි වල් අලි රංචුවලින් ගම්මානවල වැසියන්ගේ කුඹුරු, හේන්, ගොවිතැන්වලට විශාල ලෙස අලාභ හානි සිදුවන බවට ලැබෙමින් තිබුණු පැමිණිලි රාශිය ගැනද සලකා බැලූ නිලධාරීහු ඇත්ගාලක් ඒ ප්‍රදේශයේ පැවැත්වීමට නිර්දේශ කළහ. එම ඉල්ලීමට ආණ්ඩුකාරයාගේ අනුමැතිය ලැබුණි.

වල් අලින් අල්ලා මෙල්ලකොට බැඳ ගැනීම ඉතා අනතුරුදායක වූ ත්‍රසජනක අත්දැකීම් ලද හැකි දුෂ්කර කාර්යයක් විය. ඇත්ගාලක් පවත්වා අවසාන වනතුරු කුමකින් කුමක් වේදැයි කිසිවෙකුට අනුමාන කළ නොහැකි විය. අනපේක්ෂිත මෙවැනි සිදුවීම් නිසාම අතීතයේ පැවැත්වූ ඒවා ඇත්ගාල් ප්‍රසිද්ධියට පත්විය. ''කුරුණෑගල ඇත්ගාල්'' නමින් හැඳින්වුණු ඇත්ගාල පැවැත්වූ සතිය තුළ හා ඉන් පසු මුහුණ පාන්නට සිදුවූ ත්‍රසජනක අත්දැකීම්වල විස්තර ලංකාව පුරා මහත් ආන්දෝලනයක් ඇතිකිරීමට සමත්වූවා පමණක් නොව එංගලන්තයේ පුවත්පත්වල පවා ඒ සම්බන්ධ විස්තර පළවූ බව කියැවේ.මෙම ඇත්ගාල පවත්වනු ලැබුවේ 1920 අගෝස්තු මස අවසානයේ එවකට වැඩබලන ආණ්ඩුකාරවරයා වූ ග්‍රිම් තොම්සන් මහතා සහ එම ආර්යාවගේ සහභාගිත්වයෙනි.

ඇත්ගාල පැවැත්වීමට ගත් තීරණය වයඹ පළාතේ ඒජන්ත ඩී. ආර්. කම්බලන්ඩ මහතාට දන්වීමෙන් පසු ඒ මහතාගේ මග පෙන්වීම මත ගාල සකස්කිරීමේ කටයුතු ඇරඹිණ. අඹන්පොළට නුදුරු වනාන්තරය මැද ''පීල්ල'' නම් ප්‍රදේශය ඇතුන් ගාල්කිරීමට සුදුසු යැයි තෝරා ගන්නා ලදී. ඒ ස්ථානය දක්වා බඩුබාහිරාදිය ප්‍රවාහනය කිරීමට හා ආණ්ඩුකාරවරයා ඇතුළු ප්‍රභූන් කැඳවා ගෙන යා හැකි පරිදි මාර්ගය හෙළි පෙහෙලි කිරීම, පළමුවෙන්ම කරන ලද කාර්යයයි. මේ සියලු කාර්යයන් සඳහා පී.බී. මඩගපොල රටේ මහත්තයාගේ අණ පරිදි වන්නිහත් පත්තුවේ මිනිසුන් 9000 ක් පමණ යොදවා ගත් බව වාර්තාවී ඇත. ආණ්ඩුකාරවරයාගේ වාඩිය, මහලේකම් වාඩිය, ඒජන්ත වාඩිය ආදී විශේෂ ආරාධනයන් සඳහා ඉතා අලංකාර වාඩි යෝජිත ඇත්ගාල පසෙකින් උස්ව සිටින සේ සූදානම් කළ අතර ආණ්ඩුවේ අනෙකුත් නිළධාරීන් සඳහාද කාර්යාල මඩු කූඩාරම් තැපැල් කන්තෝරු, පොලීසිය, හෝටල් කඩසාප්පු හා බිමහල් ආදියෙන් අංග සම්පූර්ණ ගාල් නගරයක් සති කිහිපයක් ඇතුළතදී කඩිනමින් නිම කළේය.

ගාල් වැට බැඳීමේදී කොටුව ඇතුළත් පඳුරුවලට හෝ ගහ කොළවලට කිසිදු හානියක් නොවන්නට වගබලා ගත යුතු විය. ඒ විශේෂයෙන්ම ගාලට ඇතුළු කරන පැත්තේ අතු රිකිලි කැඩී තැලී පොඩිවී ඇති බවට වල් අලීනට ඉව වැටුණහොත් ඔවුන් කොටුව තුළට ඇතුළු වීමෙන් වළකිනු ඇති බැවින් වඩාත් ප්‍රවේශමෙන් වැට බැඳීමේ කටයුතු කළ යුතු විය. අඟල් 10-12 තරම් වටරවුමැති කොට, අඩි 3 ක් පමණ පොළොව යටට හාරා සිටුවීමෙන් පසු අඩි 10 ක් පමණ උසට සිටින සේ ගල්වැට සකස්වුයේය. මේවා එකිනෙක පේළියට සිටුවීමේදී යාන්තමින් මිනිසෙකුට එයින් රිංගා යාමට ඒමට ඉඩ ඇති පරතරයක් තබා එසේ කරන ලදී. හරස් කණු හා වැල්ඩිංකුරු සහිත විශාල හේත්තු කණු සිටවීමෙන් වැට පෙරළාගෙන යාමට නොහැකි වන පරිදි සවි ශක්තිමත්ව නිම කිරීමේ වැඩ සිදුවූයේ මෙවැනි කටයුතුවල අත්දැකීම් ඇති පළපුරුදු අයගේ උපදෙස් අනුවය

ගාල් භූමියේ දිගින් හා පළලින් අඩි 600 ක් පමණ වන සේ මෙසේ වැට බැඳීමත් හා වල් අලි එළවා ගෙන විත් ගාලට ඇතුල් කරන පැත්තේ දෙපසින් අතු කොළවලින් වැසී තිබෙන පරිදි දිග වැටත් පෙළට තනා ඒ දෙවැට අතරින් අලිගාලට ඇතුළුවූ පසු ඔවුන් කොටුවන සේ වැසීමට ගේට්ටුද පිළියෙල කරන ලදී. ඇත් ගාලේ තවත් අමාරු කාර්යයක් මෙසේ නිමාවට පත්වුණි.

අලි ඇතුන් ඇල්ලීමේදී නම් දරා සිටි පනික්කලයින්ද සිය දස්කම් පෑමට සූදානමින් ඇත්ගාල් නගරටය ළඟාවී සිටි අතර ලංකාවේ නොයෙක් පළාත්වල විසිර සිටි වල්අලි මෙල්ල කොට ගස් බැඳීමේ කටයුතුවලට යොදවා ප්‍රසිද්ධියට පත්ව සිටි හීලෑ ඇතුන් කීප දෙනෙකුද ඇත්ගාල වෙත ගෙන්වා ගන්නා ලද්දේය. මේ අලි අතර මාපිටිගම වලව්වේ ඇම්.ඇස්. බණ්ඩාර මහතාට අයිතිව සිටි ''බෙලිගම්මනයා'' නමැති ලංකාවේ එවකට සිටි විශාලම අලියා ද ඊ.ඕ. ජයවර්ධන මහතාගේ ප්‍රසිද්ධ ''කඳිරා'' ද ටී.බී. නුගවෙල මහතාගේ ''ගෝමරයා''ද ජේ. එච්. මීදෙණිය මහතාගේ ''කඳිරා'' ද වූහ.

මේ අතර කොටුකර ගැනීම සඳහා අවට වනාන්තරයේ හැසිරෙමින් සිටි වල් අලි රංචුවල ගමන් බිමන් ගැන සෝදිසි කිරීම සඳහා පී. බී. මඩගපොල රටේ මහත්තයා යැවූ පිරිස් අලි ඇතුන් 50-60 ක පමණ රංචු දෙකක් ගැන වාර්තා කළහ. මේ රංචු වට කොට රැකවල් තැබීමට රටේ මහතාගේ මිනිසුන් 1500 ක් යෙදවූහ. නමුත් සැතපුම් 12 ක පමණ මිනිස් වළල්ලක් සඳහා මේ පිරිස අල්ප වූයෙන් තවත් ගම් ප්‍රධානීන් 5 දෙනෙකුගේ කණ්ඩායම් ඒ සඳහා කැඳවන ලදී. කොටුවේ සිටි ඇතුන් අනුක්‍රමයෙන් ඇත්ගාලට අවට වනාන්තරය වෙත එළවා ගෙනවිත් ඔවුන් ගාල තුළට එළවීම සඳහා අවසාන අණ ලැබෙන තෙක් සියළු පිරිස් සූදානමින් තබා සිටියහ.

1920 අගෝස්තු මස 17 වැනි දා එහි දා එහි ළඟා වූ ආණ්ඩුකාරවරයා ඇතුළුව සම්භාවනීය පිරිස් ඇත්ගාල භාරව සිටි නිලධාරීන් විසින් මහත් හරසරින් පිළිගෙන මණ්ඩපයක් වෙත කැඳවා ගෙන යන ලදී. මෙදින පිරිස ගාල අවට පරීක්ෂා කොට ඒවා පිලියෙල කරමින් සිටි ගම් ප්‍රධානීන් හමුවේ පිළිසඳරෙහි යෙදෙමින් ඒ ඒ අය ධෛර්යය ගැන්වීමෙහි යෙදුනහ. ගාල සාර්ථකව පැවැත්වීම සඳහා මෙතෙක් කර තිබුණු වැඩ කටයුතු ආණ්ඩුකාරවරයාගේ පැසසුමට ලක්විය.

ඇත්ගාල පැවැත්වීම සඳහා මුලදී ප්‍රවේශපත් නිකුත් කළත් කලකට දක්නට නොලැබෙන ත්‍රාසජනක සිදුවීම් පැහැර නොහැර දැක ගන්නා අටියෙන් නගර ගම්මානවලින් වැල නොකැඩී සෙනඟ ගාල් නගරය කරා ඇදී එන්නට වූහ. මඟ දෙපස හතු පිපෙන්නාක් මෙන් පැන නැගුණු හෝටල් කඩ

බක්කි ආදියේ කෑම බීම පළතුරු ආදිය තබා වෙළඳාම් කළ ඇත්තෝ එමඟින් සැහෙන මුදල් උපයා ගත්හ. කොටින්ම දින කීපයක් ඇතුළතදී ඇත්ගාල් නගරය හා එයට ප්‍රවේශ මාර්ගය සරුසාර සල්පිලක් බවට පත් වී තිබුණි.

පසුදින උදේ 8.15 ට ආණ්ඩුකාරවරයා ඇතුළු පිරිස මණ්ඩපය වෙත පැමිණ තම තමන් වෙත පවරා තිබුණු අසුන්වල වාඩි වූහ. විශේෂ අමුත්තන් සඳහා දෙපස සාදා තිබූ මණ්ඩපයද අතුරු සිදුරු නැතිව පිරී ගියහ. ආරාධිතව පැමිණ සිටි අමුත්තන් අතර ප්‍රධාන පෙළේ රදළවරුන්ගේ භාර්යාවන් ඇතුළු කුල කාන්තාවන් රාශියක් ද වෙනම පනවා තිබූ මණ්ඩපයක අසුන්ගෙන සිටියේ එහි පැවති අලංකාරය තවත් වැඩි කරමිනි. අලි එළවන්නන් දින කීපයක් තිස්සේ නිදිවරාගෙන ගිනි මැල තැනින් තැන ගසා රැකවල් වැට තව තවත් තර කර තබා ගැනීම නිසා කොටුවී සිටි වල් අලින් ආහාර හිඟයෙන් හා වතුර පිපාසයෙන් පීඩිතව නොසන්සුන් වී සිටියහ. කාගේත් නෙත් සිත් යොමුවී තිබුණේ ගාල තුළටය. කවර මොහොතක හෝ වල් අලීන් එයට කොටුවනු ඇත. මේ අවස්ථාවේ දැඩි නිහඬතාවක් ගාල් ප්‍රදේශය පුරා පැතිර තිබුණේය.

ගාලට අලි එළවීමේ අවසාන නියෝගය ලැබුණු වහාම අලි රළ වටා රඳවා සිටි පිරිස් අහසට වෙඩි තබමින් බෙරවාදනය කරමින් හා වෙනත් ආකාරයේ ඝෝෂා පවත්වමින් කොටුවේ සිටි අලි ගාල දෙසට පන්නා ගෙන වළලාකාරයෙන් ඉදිරියට එන්නට වූහ. මණ්ඩපවල රැස්වී සිටි පිරිසට අලිගාලේ සිට සැතපුමක් පමණ අතින් මෙසේ ඇසෙන්නට පටන් ගත් ඝෝෂාව අනුක්‍රමයෙන් ළං ළංව ඇසෙන්නට විය. පැය බාගයකට පමණ පසු එක් අලියෙක් කොටුව තුළට දුවවිත් තමා රංචුවෙන් වෙන්ම තනිවී ඇති බව වටහා ගෙනදෝ කොටුවෙන් මිදී රංචුව සොයා දිව ගියේය. මෙයින් ටික වේලාවක් ගත වෙත්ම අලි 5 දෙනෙක් ගාල තුළට ඇතුළු වී ඒ මේ අත දුවනු දක්නට ලැබිණි. අනතුරුව ගාල ඉස්මත්තේ තිබුනු වතුර කඩිත්ත දෙසට ඔවුන් යනු දක්නා ලදී.

මීළඟට 21 දෙනෙකුගෙන් යුත් රංචුවක් එකිනෙකා පසුපස පැමිණ මංකඩක් ඔස්සේ ගාල තුළට හිමින් සිරුවේ පියවර තැබූහ. මේ අලි රංචුවද දිය කඩිත්ත දෙසට ගිය අතර අවසාන වශයෙන් අලි ඇතුන් 13 දෙනෙකුගෙන් යුත් රංචුවක් ගාල තුළට පිය නැගූහ. මෙසේ 39 දෙනෙකු කොටු වූ පසු ගාල් දොර වසා දමන ලදී. කොටුවූ රංචුවට ඉතා උස මහත තේජාන්විත පෙනුමින් යුත් දළ ඇතකු සහිත අලි ඇතුන් කීප දෙනෙකු වූහ. කුඩා අලි පැටවුන් කීප දෙනෙකු ද රංචුව අතර ඒ මේ අත දුවමින් සිටිනු දක්නා ලදී.

මෙසේ වල් අලි සාර්ථක ලෙස ගාල තුළට එළවා ගෙන ඒමේදී වෙඩි බෙහෙත් කැවූ තුවක්කු මිස උණ්ඩ දැමූ තුවක්කු පාවිච්චිය සම්පූර්ණයෙන්ම තහනම් කෙට තිබුණද අලි එළවා ආ සිය ගණන් මිනිසුන් අතුරෙන් අඩු වශයෙන් එක් අයෙකු තහනම් නියෝගය නොතකා උණ්ඩ දැමූ වෙඩි තබමින් සිටීමේ ප්‍රතිඵලය වූයේ ආණ්ඩුකාරවරයා සිට මණ්ඩපය දෙසට වෙඩි පහරවල් කීපයක් එල්ල වීමය. අසල මණ්ඩපයේ සිටි කාන්තාවෝද කලබල වී ඒ මේ අත විසිරී ගියහ. මේ අතර මැක්සේවෙල් ජොන්ස්ටන් නැමැති සුදුකාන්තාවගේ හිස අසලින් පිටවී ගිය වෙඩි උණ්ඩයක් අසල සිටි වීරතුංග නම් කැලෑ ආරක්ෂක නිළධාරියෙකුට වැදී බරපතල ලෙස තුවාල සිදුවිය. වෛද්‍යවරයෙකු කැඳවා සෝදිසි කිරීමෙන් පසු ආණ්ඩුකාරවරයාගේ රථයෙන් ම රෝහලට යවන ලදී. මෙසේ වෙඩි වැදීම නිසා තවත් අයකුටද ප්‍රතිකාර ලබා දීමට සිදුවිය. වෙඩි උණ්ඩ කොයි

පැත්තෙන් එන්නේදැයි සොයා බැලීමට හෝ එය ක්ෂණිකින් නවත්වාලීමට ක්‍රමයක් නොවීය. සියල්ලටම සිටි තැන්වලම ඇලවී සිටින ලෙසට තව දුරටත් අණ ලැබිණි. ඒ නිසා වෙඩි වැදීමෙන් සිදුවිය හැකිව තිබූ තවත් අනතුරු වළක්වා ගත හැකි විය. එදින සවස 2.00 ට අලි අල්ලා ගස් බැඳීමේ කටයුතු ආරම්භ කිරීමට නියමිත විය. එතෙක් සියළු දෙනාමට මණ්ඩපයෙන් ඉවත් වන ලෙස දන්වන ලදී. අලි ගාල් කිරීමේ පළමුවන අදියර අවසාන වූයේ මේ අන්දමිනි.

කොටුවේ සිටි වල් අලි මෙල්ල කොට අල්ලා ගස් බැඳීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර පැරණි සිරිත් අනුගමනය කරමින් අසල දේවාලයකට කදිරා, බෙලිගම්මානයා, ගෝමරයා, ආදී හීලෑ අලි ගෙන ගොස් ඔවුන් දන ගස්වා දේවාශිර්වාද ලබා දී අලින්ගේ නළල් තලවල මැතුරූ තෙල් ගල්වා ආරක්‍ෂා කරන ලදී. අලි බඳින්නෝද මෙසේ දේවාලය ඉදිරියේ දණගසා වැද පුදා අයියනායක දෙවියන්ට සහ නව රටට අධිගෘහිත දෙවියනට පඬුරු බැඳ තමන්ගෙ ආරක්‍ෂාව සලසා දෙන ලෙසට භාරවූහ.වල් අලින් අල්ලා ගස් බැඳීම සිදුකළේ මෙසේය.

මේ සඳහා යෙදූ හීලෑ අතුන් පිට නැගුණු ඇත් ගොව්වෝ සිය ජීවිත පරදුවට තබා වල් අලි කොටු කිරිමේ නිරත වූහ.මේ අවස්ථාවේදි බෙලි ගම්මන නම් හස්තියාගේ වලිගයෙන් කොටසක් වෙනත් අලියෙකුගේ පර දීමකින් කැඩී ගියේය.බෙලිගම්මානයාගේ සිඳී ගිය වලිග කොටසට බෙහෙත් ගල්වා වෙළුම්පටි යොදා බැදතැබූ අතර තුවාල ලබා සිටි අනිත් ඇතාටද මෙසේ ප්‍රතිකාර ලබාදෙන ලදී. අලි ඇතුන් එළවීම සහ ගස් බැඳීමේ රාජකාරිය අවසාන වූයේ මේ අන්දමටය.

වෙහෙසව සිටි ඇත් ගොව්වෝ සිය රාජකාරි අවසානයේ තෑගිබෝග ආදිය ලබා කා බී ප්‍රිතිවෙමින් සිටියහ. ඇත්ගාලේ තමන්ට නියමිතව තිබුණු වැඩ කොටස අවසන් වූ බැවින් අලි ඇතුන් තම තමන්ගේ ගම් රටවල්බලා ගෙන යමින් අඹන්පොළට සේන්දු වූහ. මේ දක්වා බෙලිගම්මානයා බලා කියා ගත් ඇත්ගොව්වා අලියාට ඉතා ආදරයෙන් සැළකූ අතර අලියාද ඇත් ගොව්වාට ඉතා කීකරු බවක් දැක්වීය. සිද්ධිය වන අවස්ථාවේදී ඇත්ගොව්වා තම සහයින් සමග කා බී ප්‍රීතිවෙමින් තමාට තෑගි ලැබුණු අළුත් සරමක් ද ඇඳගෙන අලියා වෙත ගිය අවස්ථාවේ ඔහු හොඬවැලෙන් ගෙන බිම ගසා පෑගුවේය.

වලිගය අහිමි වී ඇතිවූ තුවාල නිසා වේදනා විඳිමින් නොඉවසිලි මත්ව සිටි නිසා හෝ ඇත්ගොව්වා ඇඳ සිටි අළුත් ඇඳුම නිසා එක්වරම හඳුනා ගැනීමට නොහැකි වූ නිසා මේ ඛේදජනක ඉරණමට ඔහු ගොදුරු වූ බව පෙනේ. පසුව ඇත්ගොව්වා ගේ මළ සිරුස අසළ රැදී සිටි බව වාර්තාවේ. මේ සිදුවීමත් සමග ඇත්ගොව්වාගේ සහකරු ඉදිරියට විත් අලියා අල්ලා බැඳ දැමීමට ඉදිරිපත් වූ අවස්ථාවේ ඔහුටද පහරදී බරපතල තුවාල සිදු කළෙන්, වාහාම අනරාධපුර රෝහල ගෙනයාමට සිදුවිය. සිදුවූ මේ අනපේක්ෂිත කලබලය මැද්දේ බෙලිගම්මානයා අසළ වන ලැහැබකට වැදුණේය.

මෙයින් පසු දෙසතියක් තිස්සේ බෙල්ගම්මනයා අඹන්පොල අවට ගම් වැසියන් බියගන්වමින් කළ හදිය මුළු රට පුරාම පතලව ගියා පමණක් නොව ඔහුගේ නම එංගලන්තයේ පුවත්පත්වල පවා ප්‍රචලිත විය. ලංකාවේ එවකට සිටි විශාලම අලියා පමණක් නොව ඇත් ගාල් කිරීමේ දී ද එහි ප්‍රමුඛව නම් දරා සිටි බෙලිගම්නයා ඉතා ශක්තිසම්පන්නව එකතු වන බැවින් සතාගේ පැනයාම මහත් ආන්දෝලනයකට තුඩු දුන්නේ ය. අලියා අයිතිකාර රුවන්වැලේ එම්.එස්. බණ්ඩාර මහතාට

කාරණය දන්වා විදුලි පණිවිඩයක් යැවිණ. තවදුරටත් පෙරළිකිරීමට ඉඩ නොදී මොහු අල්ලා ගැනීමට අසමත් වුවහොත් ඌට වෙඩි තබා මරා දැමීමට සිදුවෙතැයි දන්වනු ලැබීය.

තව ද අලියා ඈත වනයට පලා යෑම වළක්වාගනීමේ උපක්‍රමයක් වශයෙන් රාත්‍රී කාලයේ ඒ ඉසව්වේ ඇතිනනක බැද තැබීමට තීරණය කොට සී. එච්. බර්වික් නම් මහතෙකුගේ ඉඩමක එම ඇතින්නිය බැදතබන ලදි. බර්වික් මහතා එය අසල අලුත් බංගලාවක් තනා තිබූ අතර ඇත් ගාලේ කටයුතු නැරඹීම සඳහා පැමිණි ඔහුගේ බිරිඳ සහ දියණියද එහි නවාතැන් ගෙන සිටියේය. රාත්‍රි කාලයේදි කිසිවෙකුත් එළියට නොපැමිණි අවට ගිනි මැල දල්වා ආරක්ෂිතව නිවෙස්වලට වී සිටියහ. ඇත් ගාල සඳහා ගෙනවිත් තිබුණු බඩුබාහිරාදිය ආපසු ගෙන යමින් තිබුණු ගොන් කරත්ත පේලියක් ගම අසල නවතා ඒ අය ද විශාල ගිනි මැල දල්වා ශබ්ද ඝෝෂා පවත්වමින් නිදි වර්ජිතව සිටීම ගම් වැසියන්ගේ ධෛර්යයට හේතු විය.

බර්වික් මහතාගේ බංගලාවට ගිනි මැල දැල්වීමට ගෙදර පාවිච්චියට රැස් කොට තිබුණු දර ඉවර වූ පසු හිස් පෙට්ටි පොල් අතු ආදිය ද දමා ගිනි මැලය එළිවන තෙක් දල්වා තබා ගැනීඹට උත්සහ කරමින් සිටි නමුත් රාත්‍රි 2.00 පමණ වන විට ගිනි මැලය නිවෙමින් තිබුණේය. වරින් වර අසල වන ලැහැබක අලියා හඬ නගමින් සිටිය බැවින් බංගලාවේ කවුරුත් නැති ගෙන පසු වූහ. ටික වේලාවක් පැවති දැඩි නිශ්ශබ්දතාවයකින් පසු එක්වරම කන් බිහිරි කරන ශබ්දයක් නගමින් බංගලාවේ දොරකඩ වාඩිය කඩා බිඳගෙන අලියා මිදුලට පැන්නේ හොඬය ඔසවා දෙකන් සලමිනි. අලි නාදය කෙතරම් බියකරු වීද යත් බංගලාවේ බිත්ති පවා ඒ මොහොතේ දෙදරුමා කා ගියේය.

භීතියෙන් වෙලී සිටි නිවැසියෝ කිසිවක් කර කියා ගත නොහැකිව ගල් ගැසුණාක් මෙන් සිටියහ. බර්වික් මහතා අත තුවක්කුවක් තිබුණුත් වෙඩි තැබීමට පසු බැවේ එය වැරදී ගියොත් තමන්ට අත්වන ඉරණම ගැන සිතමිනි. වාසනාවකට අලියා ගෙමිදුලට වැදී නැවතුනේය.

ඌ ගේ වටා රවුම් කීපයක් ගොස් ගෙවත්තේ තිබුණු කෙසෙල් ගස් හා වෙනත් පළතුරුත් කඩා බුදින්නට විය. බංගලාවේ සිටි අය එසේම නිසොල්මන්ව සිටියේ බේරි පැන යාමට අවස්ථාවක් නොලද බැවිනි. පැයකට පමණ පසු අලියා ගෙමිදුලෙන් තරමක් ඈත් වූයේය. බර්වික් මහතා සිය දියණිය සහ මෙහෙකරුවෙකු ආධාර ඉල්ලා පැල දොරින් පිටත් කර හැරියේ හැම දෙනාම එක්ව පැනයාම ද අනතුරුදායක වූ බැවිනි. හැකිනම් රටේ මහත්මයාගේ ගෙදරට ගොස් ඔහු හමු වී අලියා සිටින ඉසව්ව කියා ඌ මෙල්ල කිරීමට ඇත් ගොව්වන් එවන ලෙස දන්වන්නැයි ඔවුන්ට උපදෙස් දී තිබුණි. මෙහෙකරුවා හා දියණිය ගෙයින් පිටවනවාත් සමඟම අලියා ගෙමිදුලට වැදුනේ මිනිසුන්ගේ ඉව වැටීමෙනි. තවත් අවස්ථාවක් බලා බර්වික් මහතාට සිය බිරිය සමඟ බංගලාවෙන් පැන ගම්මානයට ගොස් මිනිසුන් කීපදෙනෙකු කැඳවාගෙන බංගලාව දෙසට ආ නමුත් අලියා එයට ඇතුළු වන මග අවුරාගෙන සිටි නිසා  ආපසු ගොස් එළිවන තුරු ගමේ පාසලේ ලැගුම් ගත්තේය.

අරුනළු වැටෙත්ම බර්වික් මහතා සිය බංගලාව දෙසට පා නැගීය. අවුරුද්දක් තිස්සේ මහන්සි වී වගාකොට තිබූ කෙසෙල්, අන්නාසි, පොල් අදී ගස් මෙන්ම, අලංකාරයට වවා තිබුණු ගස් වැල් ද, පාගා බිමට සමතලා කොට තිබුණේ පිහි පොරෝවලින් සමතලා කළාක් මෙනි.

අවටින් පැමිණි මී හරක් හා ගවයින් බංගලා භූමියේ නිදැල්ලේ හැසිරෙමින් සිටිනු දක්නා ලදි. මේ අතර බෙලිගම්මනයා බංගලාවෙන් තරමක් ඈත වැව් කණ්ඩියක ගැවසෙනු දැකගත හැකි විය. මේ සියල්ලක්ම සිදු වූයේ ඉරිදා දිනකය.

පසුදින කලින් දිනයටත් වඩා ත්‍රාසජනක අත්දැකීම්වලට මුහුණ දීමට බර්වික් මහතා ඇතුළු පිරිසට සිදු විය. බර්වික් මහතා සේවකයින් 6 දෙනෙකු සහ කුලී කරුවන් කිහිප දෙනෙකුත් මුරකාවලට තබාගෙන බංගලාවේ බරාදය පසුපසින් තනා තිබුණු භාග බිත්තිය පිටුපසට වී සිටියේය. රාත්‍රි කාලයේ දල්වා තිබූ ගිනි මැලවලට අලියා කිසිදු බියක් දැක්වූයේ නැත. ගිනි මැල අතරින් අලියා එක්වරම බංගලා මිදුලට පැන ගත්තේය. උගේ හොඬවැල ඒ මේ අත දිගු කරමින් සාලයේ තිබුණු පුටු මේස ඉවකොට, භාග බිත්තියෙන් ඇතුළට හොඬ යවා තැනින් තැන පිරික්සා බැලුවේය. ඇතුලේ සිට අය ඒ ඒ තැන්වලම පහත් වී නිසොල්මනේ සිටියහ. හොඬවැල ඔවුන් සිටි තැනින් අඩියක් පමණ ඉදිරියේ ඒ මේ අත හරවනු පෙනි පෙනී දෙවියන් යදිමින් සිටියේ තමන්ට කොයි මොහොතේ හෝ අත්විය හැකි ඉරණම මෙනෙහි කරමිනි. වාසනාවට මෙන් මේ අවස්තාවේ අසල දැවෙමින් තිබුණු ගිනි මැලවලින් නැගුණු දුමාරය ගේ ඇතුළට හමාවිත් හැම තැන අඳුරක් පැතිර තිබිණි. අලියා බංගලාව තුළ සිටි අය මෙසේ බියෙන් බියපත් කොට ගෙමිදුලට වී ටික වෙලාවක් සිට ඈතින්න බැඳ තිබූ තැනට ගොස් ඇයට දිගට හරහට පහර දී වධ හිංසා පැමිණවීය. ඈත සිට බලා උන් අය කිසිවක් කියා ගත නොහී අලියා බැඳීමට සමත් අය එනතුරු නිසොල්මන් වී සිටියහ.

වරෙක ඈත වැව් කණ්ඩියට මුවා වෙමින් සිටින්නන් දෙසට ඉවකොට අලියා වියරු වැටුනාක් මෙන් ඒ දෙසට දිව යයි. එවිට ඔවුහු හිස් ලූ ලූ අත දිව යයි. නැවත වැව අද්දරට දුව යන බෙලිගම්මනයා ජලය සී සී කඩ යන සේ ගොඩ ගසමින් සිය මැර බලය දක්වයි. දිවාකාලයේ මෙසේ තැනින් තැන හැසිරුනත් හවස් වන විට බර්වික් මහතාගේ ගෙවත්ත අසලට පැමිණ තව තවත් අලාභානි කරයි.

අලියාගේ වටිනාකම, ඌ සිහි බුද්ධියෙන් සිටිනා විට දක්වන කීකරු භාවය, ඇත්ගාල් කිරීමේ දී ඌ දක්වන කාර්ය ශූර බව හා ඒ කටයුතු වලදී ලබා ඇති ප්‍රසිද්ධිය නිසා පමණක් නොව ලංකාවේ එවකට සිටි ලොකුම අලියා වීම අදී කරුණු සළකා බැලීමේ දී සතා මරා දැමීමට ගෙනා යෝජනා දිනෙන් දිනම කල් තැබිණි.

අයිතිකරු උත්සහ කළේ කොතරම් බාධක අවහිර මැද්දේ වුවත් අලියා අල්ලා බැඳ ගැනීමටය. මෙම කාර්ය ඉටු කර දීමට සමත් වුවහොත් තමනට ලබා ගත හැකි වටිනා තෑගි බෝග මිල මුදල් ආදිය ගැන දැන සිටි ඇත්ගොව්වෝ ද සතා අල්ලා ගැනීමට කළ හැකි හැම උපායක් ගැනම සිතූහ. කළ හැකි වූ දේ කළහ. ඇත්ත වශයෙන්ම මේ වන විට දෙවතාවක් අලියාගෙන් කකුල්වලට කම්බි ලණු දමා හිර කිරීමට ඇත් ගොව්වන් කීප දෙනෙකු සමත් වුවත් ඌ ඒවා කඩා දැමීමට සමත් විය.

තවත් මෙවැනි උත්සහයකදී ඇත් ගොව්වෙක් මරා දැමීම නිසා තත්ත්වය වඩාත් බරපතල ස්වරූපයක් ගත්තේය. තවත් අවස්තාවක වැව් කණ්ඩිය පෙනෙන හරියක කිතුල් ගසක් කපා දමා ඒ අසල මන්දක් අතුරා අලියා එයට හසු කර ගැනීමට උත්සහ කළ නමුත්, අලියා කිතුල් ලඟ දෙසට ළං වූයේ අවට සෑම තැනම හොඬ වැලින් ඉව ඇල්ලීමෙන් පසුවය. එහි උගුලක් අටවා ඇති බව වැටහී ඌ කකුල් උස්ස උස්සා ප්‍රවේශමෙන් අඩි තබා අවුත් මන්දේ ලණුවෙහි කෙළවරක්

හොඬවැලින් උස්සා පයින් ගසා දැම්මේ. කවදත් අලියා කෙසෙල් ගෙඩි කෑමට වැඩි කැමැත්තක් දැක් වූ බව දැන සිටි කීප දෙනෙක් තවත් උපක්‍රමයක් ගැන සිතුහ. බර්වික් මහතාගේ ගේ අසළ ගසක් යට විශාල වලක් හාරා එය තුළට මන්දක් දමා නොපෙනෙන සේ අතු කොළවලින් වසා අසල සිටි අලියා වෙත කෙසෙල් ගෙඩි විසි කොට ක්‍රමයෙන් ගස මුලට ඒමට පොළඹවන ලදි. අලියා කෙසෙල් ගෙඩි බුදිමින් ගස අසලට ආ නමුත් මදු ලණුව විහාල ගලකට ගැට ගසා ආවරණය කොට තිබෙනු පෙනී එය හොඬින් ගෙන ඈතට විසි කොට එතැනින් ඉවත් වූයේ තවත් උපක්‍රමයක් අසාර්ථක කරමිනි.

ආණ්ඩුවේ ඒජන්ත, රටේ මහත්වරු, අලි අයිතිකරු ආදීහු එක්වී සාකච්ඡා පවත්වා අලියාගේ දෙපාවලට වෙඩි තබා ඒවා තුවාල කොටැ හීලෑ ඇතුන්ගේ උපකාරයෙන් ඌ හිරකොට බැඳ ගැනීමට ඉදිරිපත් වූ යෝජනාවට එකඟ වූහ.අලියා වෙඩි තබා මරා දැමීමට ගෙන ආ යෝජනා තව දුරටත් කල් තැබිණි.

මේ අතර තවත් ත්‍රාසජනක සිදුවීමක් වැව් කණ්ඩිය අවට සිටි අලියාගේ ඉරියව් ගැන විපරමින් සිට අයට දැකගන්නට හැකි විය. අලියා වැව් කණ්ඩියේ ඒ මේ අත යමින් කිසිවෙකු තමා වෙත ළං වන බව ඉව වැටෙන විට ඒ දෙසට මඳ දුරක් දුවගොස් නැවත වැව අද්දරට ගොස් ජලකඳට පහර දෙයි. කිසිවෙකු අලියා වෙත ළං වීමට ඉදිරිපත් නොවී යැයි සිතු මෙවැනි අවස්ථාවක එක් ඇත් ගොව්වෙක් අලියාට කිට්ටු වී උගේ වලිග කොටය අල්ලාගෙන එහි එල්ලී අවට සිටි අයට මන්ද දමන ලෙස කීවේ සිය නිර්භීතකම දෙනෝ දාහක් මැද්දේ විදහා පාමිනි.

ඇත් ගොව්වාගේ බලාපොරොත්තුව වූයේ කෙසේ හෝ අලියාගේ හොඬ පහරින් වැළකී ලනු පොටවල්වලින් පසු පස දෙකකුල් හිර කොට බැඳ ගැනීමට. අලියා ඒ මේ අත ඇඹරෙමින් ඇත් ගොව්වා අල්ලා ගැනීමට වෙර දැරූ නමුත් ඇත් ගොව්වා ද වලිගට අත නොහැර එහි එල්බගෙන සිටියේය. වලිගයේ අග කොසට දෙකඩවීම නිසා ඇතිවූ තුවාල නැවතත් පෑරෙන්නට ඇතුවාට සැකයක් නැත. ඇත් ගොව්වාද වැඩි වේලාවක් මෙසේ එල්ලී සිටීමට වාරුවක් තිබුණේ නැත. මිනිසා අල්ලා ගැනීමට අසමත් වූ අලියා ඔහුත් ඇදගෙන කෙලින්ම වැවට බැස්සේය. ටිකින් ටික අලියා වැව මැදට පිය නගයි. ඇත් ගොව්වා තමා සිටි අවදානම් තත්ත්වය පෙනී උදව් ඉල්ලා මොර දෙමින් සිටි නමුත් කිසිවෙකු ඔහුට පිළිසරණ වීමට තරම් එඩිතර වූයේ නැත. ඇත් ගොවව්ා ජලයේ යටවන තෙක් අලියා වැව මැදට යාම නිසා ඔහු වලිගය අතහරිනවාත් සමගම අලියා ඔහු හොඬවැලෙන් වෙලා ගත්තේය.

මෙසේ අසරණ තත්වය පත් ඇත් ගොව්වා මර බියෙන් අලියාට දැත් ඔසවා වැඳ වැටෙද්දීම අලියා හිස නමා ඔහු වැව තුළට ඔබා හිරකරගෙන සිට ඉන් පසු තැලී පොඩිවී තිබුණු ඔහුගේ මළ සිරුර වැව් කණ්ඩිය උඩට විසි කළේය. ඒ වන විට අවට සිටි අය එල්ලයක් නොමැතිව තුවක්කුවලින් අලියා දෙසට වෙඩි තබන්නට වූහ. මේ අතර බර්වික් මහතා යාර 50 ක් පමණ ඈතින් සැඟවී සිට අලියාගේ ඉදිරි ගාතයේ උඩ කොටසට වෙඩිල්ලක් තැබුවේය. අලියා හැරී වෙඩි තැබූ අය දෙසට දුව එන්නට විය.

බර්වික් මහතා පණ බේරා ගැනීමට දුව යමින් ඔහුගේ බංගලාව මැදින් දුව ගොස් පසුපස දොරකින් එලියට පැන යාර ගණනක් ඈත තවත් කුඩා ගෙයකට වැදුණේය. අලියාද බර්වික් මහතා

පසුපසින්ම දුව එමින් බංගලාවේ ගරාදි වැට තාප්ප ආදිය පොඩි පට්ටම් කරමින් ඔහු සොයන්නට විය. වාසනාවකට බර්වික් මහතා සැඟවූ තැන අලියාට නොපෙනුණු බැවින් බර්වික් මහතාගේ බංගලාවට හැරී ගොස් එයට අලාභානි කොට අසළ තිබූ රුස්ස ගසකට පහර දෙමින් උගේ කෝපාවේශය පිට කළේය.

මේ වන විට බර්වික් මහතා සැඟවී සිටි තැනින් නැවත දුවනු අලියාට දක්නට ලැබී බංගලාව වටා ගොස් වැට බිඳගෙන ඔහු ලුහුබැඳ ගිය ද බර්වික් මහතා නැවතත් නොපෙනී ගියේය.

මේ අතර අලියා බර්වික් මහතා අතුරුදහන්වූ ඉසව්වේ ඒ මේ අත විපරමින් බලද්දී අවට සැඟවී සිටි අය ඌට ගල් මුගුරුවලින් හා අතට අසුවූ සෑම ආයුධයකින්ම ගැසීම නිසා තව දුරටත් වියරු වැටුණු අලියා දුව ගියේ අසල තිබූ පන්සලකටය. පන්සල් භූමියේ ගහකොළ කඩා පාගා විනාශ කොට පන්සල් භූමියේ ගොඩනැගිලිවලට ද අලාභානි කරද්දී විහාරයේ එක් කාමරයක භික්ෂූන් වහන්සේලා ඇතුළු පිරිසක් සැඟවී සිටියහ. එය තුළින් ශබ්දයක් ඇසී අලියා කාමරයේ ජනේලය කඩා දැමූ නමුත් කිසිවෙකු ඒ තුළ සිටිනු අලියා දැක්කේ නැත.

අලියා මරා දැමීම මේ වන විට විටත් කල් දමමින් තිබුණේ උගේම වාසනාවට විය යුතුය. අලියා අල්ලා බැඳීමේ උපක්‍රම කිසිවක් සාර්ථක නොවූ තැන පලපුරුදු ඇත් ගොව්වෝද ඒ සඳහා ඉදිරිපත් වීමට මැළි වූහ.  මේ වන විටත් බොහෝ දෙනෙක් තම තමන්ගේ හීලෑ ඇතුන් රැගෙන ප්‍රදේශයෙන් පිටවී ගොස්  සිටියහ.

කොතෙක් බාධා තිබුණත් ඉදිරිපත් වූ කාර්යයන් ඉටු වන තුරුම පසු නොබසින විරල ගණයේ පුද්ගලයෝ කවදත් සිටියහ. අලියාගේ බිහිසුණු හැසිරීම ඉදිරියේ බිය නොවී  තව දුරටත් උගේ ඉරියම් ගැන පරීක්ෂාවෙන් සිටි ඇත් ගොව්වෝ දෙදෙනෙක් වූහ. ඔවුනට අලියාගේ හැසිරීමේ හදිසි වෙනසක් ගැන දැනී කෙසෙල් කැන් කීපයක් හා රැහැන් පොටවල් ද රැගෙන විශාල ගසකට නැගී අලියා දෙසට කෙසෙල් ඇවරි  විසි කරන ලදි. ඒවා බුදිමින් ගස මුලට කිට්ටු වූ අලියාට අණ කළේ පරීක්ෂා කර බලනු පිණිසය. ඌ දුන් අණ අනුව හැරුණේය. දණ ගැසුවේය. අලියා නැවත යථා සිහියෙන් පසු වන බව වටහා ගත් ඇත් ගොව්වෙක් ඌගේ පිටට නැග ගත්තේය. ඉන් පසු අලියා කිසිම කලබලයක් කළේ නැත. අනිත් ඇත් ගොව්වාගේ සහය ද ලබා ගෙන අලියා මෙල්ල කර ගැනීම නිසා ඔවුනට අගනා තෑගි බෝග ලැබුණාට සැක නැත. වයඹ පළාතේ පැවති මේ ඇත් ගාල බොහෝ කලක් යන තුරු වන්නිකරයේ වැසියන්ගේ  මතකයේ රැඳී තිබුණේ බෙලිගම්මානයාගේ මේ චන්ඩිකම් නිසාය.

මේ ඇත් ගාල ඉතා සාර්ථක ලෙස පැවැත් වූ බවත් අලි ඇතුන් 39 දෙනෙකු ඊට කොටු වූ බවත් සඳහන් කරන දිසාපතිවරයා ඒ අතරින් අලින් 34 දෙනෙකු මදු දමා අල්ලාගත් බව සිය වාර්ෂික පාලන වාර්තාවේ සඳහන් කොට ඇත.

(බණ්ඩාර මනතුංග මහතා විසින් 1984 අගෝස්තු 19 -26 වන දිනවල දිවයින ඉරිදා සංග්‍රහයට පළකරන ලද ලිපියක් ඇසුරිනි.)